# ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය - 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.2.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

2005 අංක 4 දරන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතන ආඥා පනතේ 4(ඇ) සහ (ඉ) වගන්ති පරිදි සමාලෝචිත වර්ෂය තුළදී පවත්වන ලද කෙටිකාලීන පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර ආයතනයේ සමාලෝචිත වර්ෂයේ වැඩ කටයුතුවල ප්‍රතිඵලය රු.4,508,788 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,942,815ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු.6,590,000 ක රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු එකී ඌනතාවය රු.2,081,211 ක අතිරික්තයක් බවට පරිවර්තනය වූ අතර ඉකුත් වර්ෂය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා ලද රු.3,187,000 ක් රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු එම

වර්ෂයේ ඌනතාවය රු.1,244,185 ක අතිරික්තයක් බවට පරිවර්තනය වීම හේතුවෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.837,026 කින් වැඩි වීමක් දැක්වුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ආයතනය, සමාලෝචිත වර්ෂය තුළදී "Critical Literary Reading Skill" නමැති කෙටිකාලීන පාඨමාලාවක් පවත්වා තිබුණි. කෙසේ වෙතත්, පාඨමාලාව පිළිබඳ දැන්වීම් පළවීමෙන් පසු එය ආරම්භ කිරීම දෙවතාවක් කල්දමා තිබුණි. පාඨමාලාවේ ඇස්තමේන්තුගත ආදායම රු.540,000 වුවත් සමාලෝචිත වර්ෂයේදී එකතු කළ තථ්‍ය ආදායම රු.242,800 ක් පමණක් විය.

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

ආයතනයේ 2009 - 2012 දක්වා කාලය සඳහා වූ සංයුක්ත සැලැස්ම කාලීන පදනමක් මත සමාලෝචනය කර යාවත්කාලීන කර නොතිබුණි.

### 4.2 ක්‍රියාකාරී සැලැස්ම

(අ) 2012 ක්‍රියාකාරී සැලැස්ම, සංයුක්ත සැලැස්ම සමග අනුකූල නොවිය. ඉංග්‍රීසි මාධ්‍ය උපදෙශනය පිළිබඳ පශ්චාත් උපාධි සහතිකපත්‍ර පාඨමාලාව, 2012 වර්ෂයේදී ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට උපලේඛන ගත කර තිබුණ නමුත් ආයතනය විසින්, එය 2014 වර්ෂය දක්වා ප්‍රමාද කර තිබුණි.

(ආ) අවසන් විභාගය, ඇගයම හා ප්‍රතිඵල නිකුත් කරීම වැනි කාර්යයන් නිශ්චිත කාලසීමාව තුළ සිදුකර නොතිබුණි.

(ඇ) පශ්චාත් උපාධි ඩිප්ලෝමාව/ දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීමේ ශාස්ත්‍රපති උපාධි ප්‍රදානය කිරීම සඳහා අධ්‍යයන මණ්ඩලය විසින් 2012 මාර්තු මාසයේදී කරන ලද යෝජනාව, අනුමත කර තිබුණු අතර මාස 09 කට පසුව 2012

දෙසැම්බර් 21 දින පාලක මණ්ඩලය විසින් ඒ සඳහා අනුමැතය ලබා දී තිබුණි. කෙසේ වෙතත්, 2013 මාර්තු වන විටත් පාඨමාලාව ආරම්භ කර ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.3 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන වැඩසටහනෙහි සමාලෝචිත වර්ෂය තුළදී ආයතනයේ කටයුතු වලින් 60% ක පරික්ෂා කරන බව සඳහන් වී තිබුණද, සමලෝචිත වර්ෂය සඳහා එක් විගණන විමසුමක් පමණක් නිකුත් කර තිබුණි.

## 4.4 අයවැය පාලනය

තථ්‍ය ආදායම, අයවැයගත ආදායමට වඩා සියයට 114 කින් ඉක්මවා තිබූ අතර තථ්‍ය පුනරාවර්තන වියදම්, අයවැයගත පුනරාවර්තන වියදමට වඩා සියයට 33 කින් අඩු වී තිබුණි. ඒ අනුව අයවැය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 4.5 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

ආයතනයේ 2010 සහ 2011 වර්ෂවල වාර්ෂක වාර්තා 2013 මාර්තු 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභා ගත කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

පහත සඳහන් පාලන ක්ෂෙත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමු විය යුතුවේ.

(අ) පාඨමාලා පවත්වාගෙන යාම සහ ප්‍රතිඵල නිකුත් කිරීම.

(ආ) කාර්ය මණ්ඩලය බඳවා ගැනීම.

(ඇ) අයවැය.